කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுப்படுத்துகை அமைச்சு

Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය.
எனது இல.
My No
MWCA/04/01/
14/2022

ඔබේ අංකය.
உமது இல.
Your No.

දිනය.
திகதி.
Date
25/11/2022

කාන්තා හා ළමා කටයුතු චක්‍රලේඛ: 01/2022

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්

සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්,

**<u>ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූලවන අයවැයකරණය (Gender Responsive Budgeting) ඉදිරි අයවැය සැලසුම් සකස් කිරීමේදී පදනම් කර ගැනීම.</u>**

ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සම සාධාරණ වන පරිදි සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රතිලාභ බෙදීයාමත්, අයිතිවාසිකම් සුරකුනු සමාජ ආර්ථික පරිසරයක් ගොඩනැංවීමත් අත්‍යවශ්‍ය ක්‍රියාදාමයකි. තිරසර සංවර්ධන ඉලක්ක 5.1.c තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීමට රාජ්‍ය මුදල් වෙන් කිරීම සහ එම මුදල් ප්‍රතිපාදන නියාමනයට ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව, ඉදිරි වාර්ෂික අයවැය සැළසුම්කරණයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගත් අයවැයක් සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ ලබා දීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලාංකික කාන්තාවන් මුහුණ දෙන විවිධ සමාජ ආර්ථික ගැටළු කෙරෙහි අවධානය යොමු කර එම ගැටළු අවම වන අයුරින් අයවැයකරණය හා ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු අතර ඒ අනුව සියලුම අමාත්‍යංශ තම විෂයය පථයට අදාළව සිදුකරන වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කළ යුතුය. එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය විශ්ලේෂණ (Gender Analysis) පදනම් කොටගත් සැලසුම් සකස් කිරීම හා අයවැයකරණය ( GAD Planning & Budgeting) ඒ ඒ ආයතනය තුල ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම. ඔබ ආයතනයේ විෂය ක්ෂේත්‍රය තුල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනුව හඳුනා ගන්නා ගැටළු (Issues) පරතරයන් (gaps) අවම කිරීම සහ ඒවා මුලිනුපුටා දැමීමට ක්‍රමානුකූලව නිර්මාණය කරන ලද වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් මූලිකව හඳුනා ගැනීම.


| | කාන්තා, ළමා කටයුතු | සමාජ සවිබලගැන්වීම් |
|---|---|---|
| ලේකම් / செயலாளர் Secretary:- | 011-218605 | 011-2883525 |
| කාර්යාලය/ அலுவலகம் /office | 0112186055 | 0112887349-51 |
| ෆැක්ස්/ பெக்ஸ் Fax: | 011-2187249 | 011- 2187007 |
| ඊමේල්/மின் தபால் / Email: | secretary@childwomenmin.gov.lk | msesecretary@sltnet.lk |
| වෙබ් අඩවිය/ இணையத்தளம் / Website: | www.childwomenmin.gov.lk | www.stateminsamurdhi.gov.lk |
| | 05 වන මහල, II අදියර ,සෙත්සිරිපාය, බත්තරමුල්ල. | 01 වන මහල, II අදියර ,සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| | 05 ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை. | 01 ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை. |
| | 05th Floor, Stage II, Sethsiripaya,Battaramulla | 01st Floor, Stage II, Sethsiripaya,Battaramulla |

2. ශ්‍රී ලංකාව විසින් අත්සන් කර ඇති කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් සහ හිංසනය පිටු දැකීමේ ජාත්‍යන්තර සම්මුතියේ (CEDAW) නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය, කාන්තා ආර්ථික සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය අවම කිරීම යන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම.

3. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණය අමාත්‍යාංශය තුල ක්‍රියාත්මක කිරීමට පූර්ව අවශ්‍යතාවයක් ලෙස ස්ත්‍රී පුරුෂභාවය අනුව විභේදිත දත්ත හා තොරතුරු පද්ධතියක් පැවතීම අවශ්‍ය වේ. ඒ අනුව සියලු අමාත්‍යාංශ තම විශය පථයට අදාළ වන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාළ වන පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූල ව විභේදිත දත්ත හා තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.

ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව ඉදිරි වාර්ෂික සැලසුම් සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව ව්‍යාපෘති හා වැඩසටහන් සකස් කර ජාතික අය වැය දෙපාර්තමේන්තුවටද පිටපත් සහිතව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

තවද වාර්ෂික සැලසුම්කරණයේදී හා අයවැය කරණයේදී, ස්ත්‍රී පුරුෂ සමජභාවීය සම සාධාරණත්වය ඉටුකරලීම සඳහා අවශ්‍ය දැනුම හා ඒ හා සම්බන්ධ තාක්ෂණික ධාරිතාව ලබා දීම මෙන්ම මූලික කාර්ය සාධක දර්ශක (KPI) සකස් කර ගැනීමටත් හා තිරසාර සංවර්ධන දර්ශක (SDG Indicators) ස්ත්‍රී පුරුෂ සමජභාවීය ලෙස හඳුනා ගැනීමටත්, මෙම අමාත්‍යාංශයේ සහයෝගය ලබා දිය හැක. එහිදී, තොරතුරු කළමනාකරණය කිරීම හා සම්බන්ධීකරණ පහසුව සඳහා ඒ ඒ අමාත්‍යාංශ විසින් එක් නිලධාරියෙකු වෙත වගකීම පැවරීම වඩාත් සුදුසු වේ.

මෙම කරුණු සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු තොරතුරු 011-2187261 යන අංකය ඇමතීමෙන් ලබාගැනීමට හැකිය.

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරන අතර,ඒ අනුව 2019.04.08 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2019 අවලංගු වේ.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්

පිටපත - 01. විශේෂඥ වෛද්‍ය ගරු සුදර්ශිනී ප්‍රනාන්දු පුල්ලේ මැතිනිය (පා.ම.), සභාපති ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව –
02. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය.
03. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය.
04. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය .
05. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
06. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
07. විගණකාධිපති, ජාතික විගණන ලේකම් කාර්යාලය

} කා.දැ.ස.